සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**34 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

විද්‍යාව I
விஞ்ஞானம் I
Science I

පැය එකයි
ஒரு மணித்தியாலம்
*One hour*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** බහිස්ස්‍රාවී ද්‍රව්‍යයක් වන යූරියා නිපදවෙන්නේ,
(1) වකුගඩුවල ය. (2) අක්මාවෙහි ය. (3) මූත්‍රාශයෙහි ය. (4) වෘක්කාණුවල ය.

**2.** ක්ෂමතාවේ ඒකකය කුමක් ද?
(1) W s (2) $W\ s^{-1}$ (3) J s (4) $J\ s^{-1}$

**3.** අයිසොප්‍රොපිල් ඇල්කොහොල් අණුවක සූත්‍රය $(CH_3)_2CHOH$ වේ. මෙම අණුවක ඇති පරමාණු ගණන කොපමණ ද?
(1) 8 (2) 10 (3) 11 (4) 12

**4.** ශාක පත්‍ර තුළ නිපදවන ආහාර ශාක දේහය පුරා පරිවහනය කරන පටකය කුමක් ද?
(1) ශෛලම (2) ප්ලෝයම (3) කැම්බියම (4) දෘඪස්තර

**5.** වස්තු දෙකක් එකිනෙක පිරි මැදීමෙන් එක් වස්තුවකට ධන ආරෝපණයක් ලැබීමේ දී අනෙකට සංක්‍රමණය වනුයේ
(1) ඉලෙක්ට්‍රෝනයි. (2) ප්‍රෝටෝනයි.
(3) නියුට්‍රෝනයි. (4) ඉලෙක්ට්‍රෝන හා ප්‍රෝටෝනයි.

**6.** පිළිවෙළින් ආම්ලික ඔක්සයිඩයක්, උභයගුණී ඔක්සයිඩයක් සහ භාස්මික ඔක්සයිඩයක් ඇතුළත් වන්නේ මින් කුමක ද?
(1) $SO_3, Al_2O_3, SiO_2$ (2) $SO_3, Al_2O_3, MgO$
(3) $CO_2, SiO_2, MgO$ (4) $SiO_2, CO_2, Al_2O_3$

**7.** ශාක සෛලයක ඇති අජීවී ව්‍යුහයක් ලෙස ........................... හැඳින්විය හැකි ය.
(1) සෛල බිත්තිය (2) ප්ලාස්ම පටලය (3) රයිබොසෝම (4) ගොල්ගි දේහ

**8.** රූපසටහනේ දක්වා ඇති නාරටි වින්‍යාසය සහිත පත්‍ර දරන ශාකයක තවත් රූපීය ලක්ෂණයක් වන්නේ,
(1) මුදුන් මුල් පද්ධතියක් පිහිටීමයි.
(2) අතු බෙදුණු කඳක් තිබීමයි.
(3) බීජය තුළ එක් බීජපත්‍රයක් තිබීමයි.
(4) චතුර් අංක හෝ පංචාංක පුෂ්ප දැරීමයි.



**9.** විද්‍යුත්-චුම්බක තරංග හා සම්බන්ධ පහත ප්‍රකාශවලින් **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) ශක්තිය සම්ප්‍රේෂණය කරයි.
(2) රික්තයේ දී $3\times10^8 m\ s^{-1}$ වේගයකින් ගමන් කරයි.
(3) පදාර්ථමය මාධ්‍යයක දී සංඛ්‍යාතය රික්තයේ දීට වඩා අඩු වේ.
(4) පදාර්ථමය මාධ්‍යයක දී වේගය රික්තයේ දීට වඩා අඩු වේ.

**10.** අයනික සංයෝග පිළිබඳ ව සත්‍ය වනුයේ පහත කුමන ප්‍රකාශය ද?
(1) ඝන අවස්ථාවේ දී විද්‍යුතිය සන්නයනය කරයි. (2) සියල්ල ම ඉතා හොඳින් ජලයේ දිය වේ.
(3) තාපාංක හා ද්‍රවාංක ඉහළ අගයන් ගනී. (4) විලීන අවස්ථාවේ දී විද්‍යුතිය සන්නයනය නො කරයි.


[දෙවැනි පිටුව බලන්න.

ගණිතය සම්බන්ධ ම සාධම් ... Mathematics With Asela Nissanka
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**11.** ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝගයකින් පෙළෙන පුද්ගලයෙකු තුළ පහත රෝග ලක්ෂණ දක්නට ලැබේ.
- කැස්ස සමඟ රුධිරය පිටවීම
- ශරීරයේ බර අඩු වීම
- අධික වෙහෙස

මෙම පුද්ගලයාට වැළඳී තිබීමට හැක්කේ
(1) නිව්මෝනියාවයි. (2) බ්‍රොන්කයිටිස් රෝගයයි. (3) ක්ෂය රෝගයයි. (4) සිලිකෝසිස් රෝගයයි.

● අංක **12** සහ **13** ප්‍රශ්න දී ඇති රූපසටහන මත පදනම් වේ.




**12.** බාහිර පරිපථයේ දැක්වෙන ඊතලයෙන් නිරූපණය කරන දිශාවට ගමන් කරනුයේ,
(1) සම්මත ධාරාවයි. (2) ඉලෙක්ට්‍රෝනයි.
(3) $Zn^{2+}$ අයනයි. (4) $Cu^{2+}$ අයනයි.

**13.** ඉහත කෝෂයෙහි සිදු වන කැතෝඩ ප්‍රතික්‍රියාව කුමක් ද?
(1) $Zn^{2+}(aq) + 2e \longrightarrow Zn(s)$ (2) $Cu^{2+}(aq) + 2e \longrightarrow Cu(s)$
(3) $2H^{+}(aq) + 2e \longrightarrow H_2(g)$ (4) $4OH^{-}(aq) + 4e \longrightarrow O_2(g) + 2H_2O(l)$

**14.** ආලෝක වර්තනය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
*A* - ආලෝකය වර්තනය වන්නේ විරලතර මාධ්‍යයක සිට ඝනතර මාධ්‍යයකට ගමන් ගන්නා විට පමණි.
*B* - වර්තනයට හේතු වන්නේ මාධ්‍ය දෙකෙහි දී ආලෝකයේ වේග එකිනෙකින් වෙනස් වීමයි.
*C* - වර්තනයේ දී ආලෝකයේ සංඛ්‍යාතය වෙනස් වේ.
මේවායින් සත්‍ය වනුයේ,
(1) *A* පමණි. (2) *B* පමණි. (3) *A* හා *C* පමණි. (4) *B* හා *C* පමණි.

**15.** පොළොව මත දී ගුරුත්වජ ත්වරණය $10\ m\ s^{-2}$ වේ. සඳ මත දී එම අගය පොළොවේ දී මෙන් $\frac{1}{6}$ කි. පොළොව මත දී බර 60 N වන වස්තුවක සඳ මත දී බර කොපමණ ද?
(1) 10 N (2) 60 N (3) 100 N (4) 360 N

**16.** පහත දැක්වෙන ලක්ෂණ අතුරෙන් පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩයට අයත් ඒවීස් හා මැමේලියාවන්ට පමණක් පොදු ලක්ෂණ මොනවා ද?
*A* - අචලතාපීත්වය *B* - රෝමවලින් ආවරණය වූ සම
*C* - අස්ථිමය අභ්‍යන්තර සැකිල්ල *D* - කුටීර හතරක් සහිත හෘදය
(1) *A* හා *B* (2) *A* හා *D* (3) *B* හා *C* (4) *C* හා *D*

**17.** ලෝහ පිළිබඳ ව **අසත්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?
(1) මූලද්‍රව්‍යවලින් බහුතරය ලෝහ වේ.
(2) සියලු ම ලෝහ විද්‍යුතය සන්නයනය කරයි.
(3) ලෝහ පරමාණු ඉලෙක්ට්‍රෝන පිටකරමින් ධන අයන නිපදවයි.
(4) සියලු ම ලෝහ අම්ල සමග ප්‍රතික්‍රියා කර හයිඩ්‍රජන් පිට කරයි.

**18.** එක්තරා ද්‍රාවණයකට මෙතිල් ඔරේන්ජ් බිංදු කිහිපයක් එක් කළ විට එම ද්‍රාවණය රතු පැහැයට හැරිණි. එම ද්‍රාවණයේ pH අගය වීමට වඩාත් ඉඩ ඇත්තේ මින් කුමක් ද?
(1) 2 (2) 7 (3) 12 (4) 14

**19.** නැවක සිට මුහුදු පතුලට යවන ලද අතිධ්වනි තරංගයක් පරාවර්තනය වී නැව වෙත පැමිණීමට තත්පර හතරක් ගත වේ. මුහුදු පතුලට ඇති ගැඹුර 2880 m නම් මුහුදු ජලය තුළ අතිධ්වනි තරංගයේ වේගය කොපමණ ද?
(1) $720\ m\ s^{-1}$ (2) $1440\ m\ s^{-1}$ (3) $2880\ m\ s^{-1}$ (4) $3700\ m\ s^{-1}$

**20.** වායුවක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
- පහසුවෙන් දහනය කළ හැකි ය.
- සාමාන්‍ය වාතයට වඩා ඝනත්වයෙන් අඩු ය.
- ජලයේ මඳ වශයෙන් ද්‍රාව්‍ය වේ.

මෙම වායුව වනුයේ
(1) හයිඩ්‍රජන් ය. (2) නයිට්‍රජන් ය. (3) ඔක්සිජන් ය. (4) කාබන් ඩයොක්සයිඩ් ය.

**21.** හෘද ස්පන්දන වේගය පාලනය කරන මධ්‍ය ස්නායු පද්ධතියට අයත් කොටස කුමක් ද?
(1) මස්තිෂ්කය (2) අනුමස්තිෂ්කය (3) සුෂුම්නාව (4) සුෂුම්නා ශීර්ෂකය

[තුන්වැනි පිටුව බලන්න.

Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**22.** සන්නායකයක ප්‍රතිරෝධය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

*A* - සන්නායකයේ දෙකෙළවර විභව අන්තරය මත රඳා පවතී.
*B* - සන්නායකයේ දිගට අනුලෝම ව සමානුපාතික වේ.
*C* - සන්නායකය තුළින් ගලා යන ධාරාව මත රඳා පවතී.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ

(1) *A* පමණි. (2) *B* පමණි. (3) *A* හා *B* පමණි. (4) *A* හා *C* පමණි.

**23.** කැල්සියම් කාබනේට් 10 g ක ඇති කැල්සියම් කාබනේට් මවුල ප්‍රමාණය කොපමණ ද? ($CaCO_3 = 100$)

(1) 0.01 (2) 0.1 (3) 1 (4) 10

**24.** කාබොහයිඩ්‍රේට පිළිබඳ ව නිවැරදි ප්‍රකාශය තෝරන්න.


(1) සියලු ම කාබොහයිඩ්‍රේට ජල ද්‍රාව්‍ය වේ.
(2) සියලු ම කාබොහයිඩ්‍රේට ස්ඵටිකරූපී වේ.
(3) කාබොහයිඩ්‍රේටවල C හා H අතර අනුපාතය 1 : 2 වේ.
(4) ග්ලූකෝස් යනු කාබොහයිඩ්‍රේටවල තැනුම් ඒකකයයි.


**25.** දකුණු පසින් දැක්වෙන්නේ *A* හා *B* ලෝහ දෙකකින් සැදුම් ලත් ද්විලෝහ පටියකි. මෙහි වැඩියෙන් ප්‍රසාරණය වන ලෝහය *A* වන අතර අඩුවෙන් ප්‍රසාරණය වන ලෝහය *B* වේ. ද්විලෝහ පටියේ උෂ්ණත්වය වැඩි කළ විට එහි හැඩය වෙනස් වන්නේ පහත කුමන ආකාරයට ද?




(1) 


(2) 


(3) 


(4) 



**26.** ඝන ද්‍රව්‍යයකින් සාදන ලද වස්තුවක් ද්‍රවයක ඉපිලීම සඳහා

(1) ඝන ද්‍රව්‍යයේ ඝනත්වය ද්‍රවයේ ඝනත්වයට වඩා අඩු විය යුතු ය.
(2) ඝන වස්තුවේ ස්කන්ධය විස්ථාපිත ද්‍රව ස්කන්ධයට සමාන විය යුතු ය.
(3) ඝන වස්තුවේ බර එමගින් විස්ථාපිත ද්‍රව පරිමාවේ බරට සමාන විය යුතු ය.
(4) ඝන වස්තුවේ බර එය මත ඇති වන උඩුකුරු තෙරපුමට වඩා අඩු විය යුතු ය.

**27.** Tt ප්‍රවේණිදර්ශය සහිත ජීවීන් දෙදෙනෙකු අතර අන්තරාභිජනනයෙන් බිහි වන ජනිතයන්ගේ එකිනෙකට වෙනස් ප්‍රවේණිදර්ශ සංඛ්‍යාව හා රූපානුදර්ශ සංඛ්‍යාව පිළිවෙළින්,

(1) 2 හා 1කි. (2) 3 හා 2කි. (3) 4 හා 2කි. (4) 4 හා 3කි.

**28.** සර්වසම *A*, *B* හා *C* බල්බ තුනක් සහ *R* ප්‍රතිරෝධකයක් පරිපථයකට සම්බන්ධ කර ඇති ආකාරය රූපයේ දැක්වේ. *A*, *B* හා *C* බල්බවල දීප්තිය පිළිබඳ සම්බන්ධතාව නිවැරදි ව දැක්වෙනුයේ කුමන ප්‍රකාශනයේ ද?




(1) $A < B < C$ (2) $A = B = C$
(3) $A = B < C$ (4) $A < C < B$

**29.** පහත දැක්වෙන්නේ හීමටයිට් හා කාබන් මොනොක්සයිඩ් අතර ප්‍රතික්‍රියාවයි.

$$Fe_2O_3 + 3CO \longrightarrow 2Fe + 3CO_2$$

$Fe_2O_3$ මවුල එකක් භාවිතයෙන් නිපදවිය හැකි Fe ස්කන්ධය කොපමණ ද? (Fe = 56)


(1) 28 g (2) 56 g (3) 112 g (4) 168 g

**30.** වයිරස් ආසාදනයකට ලක් වූ පුද්ගලයෙකුගේ රුධිරයේ අඩංගු පට්ටිකා ප්‍රමාණය සාමාන්‍ය අගයට වඩා අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ සිරුරේ

(1) ඔක්සිජන් පරිවහනය වේගවත් වේ. (2) ප්‍රතිදේහ නිපදවීම අඩාල වේ.
(3) රුධිරය කැටි ගැසීම නිසි පරිදි සිදු නො වේ. (4) හෝමෝන පරිවහනය සෙමින් සිදු වේ.

**31.** ඍජුකෝණාස්‍ර හැඩැති තහඩු තුනක් මත ඒකතල බල යොදා ඇති ආකාර *A*, *B* හා *C* රූපවල දක්වා ඇත. ඉහත තහඩු අතුරෙන් සමතුලිතතාවේ පවතිනුයේ,

(1) *A* පමණි.
(2) *B* පමණි.
(3) *A* හා *C* පමණි.
(4) *A*, *B* හා *C* යන සියල්ල ම ය.




A B C




Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**32.** *A* - උත්ප්‍රේරක මගින් රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව වැඩි වේ.
*B* - ප්‍රතික්‍රියාව අවසානයේ උත්ප්‍රේරකයේ රසායනික සංයුතිය වෙනස් වේ.

ඉහත,

(1) *A* සහ *B* ප්‍රකාශ දෙක ම සත්‍ය වේ.
(2) *A* ප්‍රකාශය සත්‍ය වන අතර *B* ප්‍රකාශය අසත්‍ය වේ.
(3) *A* සහ *B* ප්‍රකාශ දෙක ම අසත්‍ය වේ.
(4) *A* ප්‍රකාශය අසත්‍ය වන අතර *B* ප්‍රකාශය සත්‍ය වේ.

**33.** සර්වසම නළ හතරකට කාබන් ඩයොක්සයිඩ් සමාන සාන්ද්‍රණයක් සහිත ජලය සමාන පරිමා එකතු කර රූපවල දැක්වෙන (1), (2), (3) සහ (4) ඇටවුම් සාදන ලදි. මෙම ඇටවුම් හතර ම සර්වසම ආලෝක තත්ත්ව යටතේ පැය තුනක් තැබීමෙන් පසු ව **අඩු ම** කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය ඇත්තේ කුමන ඇටවුමේ ද?





(1) (2) (3) (4)

**34.** බහුඅවයවක සම්බන්ධයෙන් දී ඇති පහත ප්‍රකාශ සලකන්න.
*A* - ඉතා ඉහළ සාපේක්ෂ අණුක ස්කන්ධයක් ඇත.
*B* - තැනීමට දායක වන කුඩා අණු පුනරාවර්තන ඒකක ලෙස හැඳින්වේ.
*C* - සම්භවය මත පදනම් ව කෘත්‍රිම හා ස්වාභාවික ලෙස වර්ග කළ හැකි ය.

මේවායින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ

(1) *A* පමණි. (2) *B* පමණි. (3) *A* හා *C* පමණි. (4) *B* හා *C* පමණි.

**35.** රූපයේ දක්වා ඇත්තේ *A* හා *B* පරිවෘත තඹ කම්බි දඟර දෙකක් මෘදු යකඩ මධ්‍යයක් වටා ඔතා ඇති ආකාරයයි. එම සැකැස්ම පිළිබඳ ව පහත කුමන ප්‍රකාශය සත්‍ය වේද?




(1) *S* ස්විච්චය වසන මොහොතේ *A* හි ධාරාවක් ගලා යන අතර *B* හි ධාරාවක් ගලා නො යයි.
(2) *S* ස්විච්චය දිගට ම වසා තැබීමේ දී *A* හි ධාරාවක් ගලා යන අතර *B* හි ද ධාරාවක් ගලා යයි.
(3) *S* ස්විච්චය වසන මොහොතේ දී පමණක් *B* හි ධාරාවක් ගලා යයි.
(4) *S* ස්විච්චය විවෘත කරන මොහොතේ දී සහ වසන මොහොතේ දී පමණක් *B* හි ධාරාවක් ගලා යයි.

**36.** ප්‍රවේග-කාල ප්‍රස්තාරය පිළිබඳ දක්වා ඇති පහත ප්‍රකාශවලින් **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) ප්‍රස්තාරයෙන් ආවරණය වන වර්ගඵලයෙන් වස්තුවේ විස්ථාපනය ලැබේ.
(2) නිශ්චලතාවෙන් චලිතය අරඹන වස්තු සඳහා ප්‍රස්තාරය ඇරඹෙනුයේ මූල ලක්ෂ්‍යයෙනි.
(3) කාලයත් සමඟ ප්‍රවේගය වෙනස් වන චලිතයක දී ප්‍රස්තාරයේ අනුක්‍රමණය ශූන්‍ය වේ.
(4) ප්‍රස්තාරයේ අනුක්‍රමණයෙන් ත්වරණය/මන්දනය ලැබේ.

**37.** සාගර පරිසර පද්ධතිවල ඇල්ගී ගහනය අසාමාන්‍ය ලෙස වර්ධනය වීමට දායක වන දූෂකය කුමක් ද?

(1) බැර ලෝහ (2) සල්ෆේට් (3) න්‍යෂ්ටික අපද්‍රව්‍ය (4) පොස්පේට්

**38.** වෙරළබඩ ප්‍රදේශවල වාසය කරන වැඩිහිටියන් කිහිප දෙනෙකු සමඟ කළ සාකච්ඡාවක දී ඔවුන් ප්‍රකාශ කළේ වර්තමානයේ වසරක දී කුණාටු ඇති වන වාර ගණනෙහි සහ ඒවායේ ප්‍රබලතාවේ වැඩිවීමක් දකින අතර, වෙරළ තීරය ඛාදනය වීම විශාල වශයෙන් සිදු වන බවයි. මෙම තත්ත්වයට ඉහළ ම දායකත්වයක් දක්වන්නේ කුමන පාරිසරික සංසිද්ධිය ද?

(1) ගෝලීය උණුසුම ඉහළ යාම
(2) හරිතාගාර ආවරණය
(3) ඕසෝන් වියන ක්ෂය වීම
(4) සුපෝෂණය

Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel

**39.** සෑම විට ම උඩුකුරු ආකාරයට පමණක් දැක්වෙන පාරිසරික පිරමිඩ වන්නේ,

(1) ජෛව ස්කන්ධ පිරමිඩයි.
(2) සංඛ්‍යා පිරමිඩයි.
(3) ශක්ති පිරමිඩයි.
(4) ශක්ති පිරමිඩ හා ජෛව ස්කන්ධ පිරමිඩයි.

**40.** ප්‍රතිචක්‍රීකරණ මූලධර්මය සඳහා නිදසුනක් වනුයේ පහත කුමන ක්‍රියාව ද?

(1) භාවිතයෙන් ඉවත් කළ ඩෙනිම් කලිසම්වලින් පාපිසි සකස් කිරීම
(2) වැඩිමහල් සහෝදරයා භාවිත කළ ඇඳුම් බාල සහෝදරයා ඇඳීම
(3) එදිනෙදා මිල දී ගන්නා ආහාර ද්‍රව්‍ය රැගෙන ඒමට එක ම රෙදි මල්ලක් භාවිත කිරීම
(4) මැහුම් ගැලවුණු ඇඳුමක් නැවත මසා ඇඳීම

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## B කොටස

- අංක **5, 6, 7, 8** හා **9** යන ප්‍රශ්නවලින් ප්‍රශ්න **තුනකට** පමණක් පිළිතුරු සපයන්න.

**5.** (*A*) මිනිසාගේ ද්විත්ව රුධිර සංසරණය නිරූපණය කිරීම සඳහා අඳින ලද රූපසටහනක් පහත දැක්වේ. *A*, *B*, *C* සහ *D* මගින් හෘදයේ කුටීර ද *P*, *Q*, *R* සහ *S* මගින් එම කුටීර හා සම්බන්ධ රුධිර නාළ ද දැක්වේ.

(i) මිනිසාගේ රුධිර සංසරණය ද්විත්ව රුධිර සංසරණයක් ලෙස හැඳින්වෙන්නේ ඇයි?


(ii) *P* මගින් නාළ දෙකක් නිරූපණය වේ. ඒවායින් ශරීරයේ අධර කොටස්වලින් රුධිරය ගෙන එනු ලබන නාළය නම් කරන්න.

(iii) පහත රුධිර නාළ නම් කරන්න.
(a) *C* කුටීරයෙන් ඇරඹෙන *R* රුධිර නාළය
(b) *D* කුටීරයෙන් ඇරඹෙන *S* රුධිර නාළය

(iv) *R* හා *S* නාළ දෙකෙහි අඩංගු රුධිරයෙහි සංයුතියේ වෙනස්කමක් දක්වන්න.

(v) *B* හා *D* කුටීර අතර පිහිටන කපාටය නම් කරන්න.

(vi) (a) *D* සංකෝචනය වී *S* තුළට රුධිරය තල්ලු කිරීමේ දී ඇති වන පීඩනය හඳුන්වන නම කුමක් ද?
(b) නිරෝගී වැඩිහිටියෙකුගේ එම පීඩනයෙහි අගය කොපමණ ද?
(c) නිරෝගී වැඩිහිටියෙකුගේ වුව ද එම අගය වරින් වර වෙනස් විය හැකි ය. ඒ සඳහා බලපාන හේතුවක් සඳහන් කරන්න.




(*B*) මානව දේහය ගොඩනැගීමට දායක වී ඇති ප්‍රධාන පටක වර්ගයක් ලෙස පේශි පටකය හැඳින්විය හැකි ය. පේශි පටක ප්‍රධාන ආකාර තුනකි. සිනිඳු පේශි පටක ඉන් එක් ආකාරයකි.

(i) මිනිස් සිරුරේ ඇති අනෙක් ප්‍රධාන පේශි පටක වර්ග **දෙක** නම් කරන්න.

(ii) බහුන්‍යෂ්ටික සෛල දරන පේශි පටක වර්ගය කුමක් ද?

(iii) ඉච්ඡානුග ව හා රිද්මයානුකූල ව ක්‍රියාකරන පේශි පටක වර්ගය කුමක් ද?

(iv) සිනිඳු පේශි පටක පිහිටි ස්ථානයක් නම් කරන්න.


(v) සිනිඳු පේශි පටකයේ සෛලයක දළ රූපසටහනක් අඳින්න.

(*C*) ශාක පටක වර්ගීකරණය පිළිබඳ රූපසටහනක් මෙහි දැක්වේ.

(i) *A* සහ *B* නම් කරන්න.

(ii) ශාක දේහයක බහුල ව ම දක්නට ලැබෙන සරල ස්ථිර පටක වර්ගය කුමක් ද?


(iii) ස්ථූලකෝණාස්තර පටකයේ කෘත්‍යයක් සඳහන් කරන්න.




(ලකුණු 20 යි.)

**6.** (*A*) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්හි ($H_2O_2$) පහත ප්‍රතික්‍රියාව පිළිබඳ අධ්‍යයනයක යෙදුණු සිසු කණ්ඩායමක් විසින් සිදුකරන ලද පරීක්ෂණයක පියවර රූපසටහන්වල දැක්වේ.

ප්‍රතික්‍රියාව : $2H_2O_2(aq) \longrightarrow 2H_2O(l) + O_2(g)$




පියවර 01 — සිරිංජය තුළ $MnO_2$ ස්වල්පයක් සහිත ප්ලාස්ටික් මූඩිය තැන්පත් කිරීම

පියවර 02 — $H_2O_2$ ද්‍රාවණය 5 ml පමණ සිරිංජය තුළට ඇද ගැනීම

පියවර 03 — $H_2O_2$ සමග $MnO_2$ මිශ්‍රකර පිට වන වායුව සිරිංජය තුළ රැස්වීමට සැලැස්වීම

[හයවැනි පිටුව බලන්න.

Scan By : "Mathematics With Ajith Nisanka" Youtube channel
Download all Past Papers>>https://bookbeekid.com/resource/past-papers/

(i) ඉහත ප්‍රතික්‍රියාව ඔබ උගත් ප්‍රතික්‍රියා වර්ගීකරණයට අනුව කුමන වර්ගයේ ප්‍රතික්‍රියාවක් ද?

(ii) ඉහත ප්‍රතික්‍රියාවේ දී මැංගනීස් ඩයොක්සයිඩ්වල ($MnO_2$) කෘත්‍යය කුමක් ද?

(iii) සිරිංජය තුළ වායුව එක්රැස්වීම ඇරඹි මොහොතේ සිට තත්පර 10 බැගින් වූ අනුයාත කාල ප්‍රාන්තර හයක දී නිපදවුණු වායු පරිමා මිනුම් කරන ලදී. එම තොරතුරු පහත වගුවේ දැක්වේ.

| කාල ප්‍රාන්තරය | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| රැස් වූ වායු පරිමාව/ml | 14 | 9 | 5 | 3 | 1 | 0 |


(a) පළමු කාල ප්‍රාන්තරයේ දී වායුව නිපදවුණු ශීඝ්‍රතාව ගණනය කරන්න.
(b) කාලය ගත වීමේ දී වායුව නිපදවුණු ශීඝ්‍රතාව කෙසේ වෙනස් වී තිබේ ද?
(c) ඉහත (b) හි ඔබ සඳහන් කළ විචලනය සඳහා හේතුව පැහැදිලි කරන්න.

(iv) ඉහත පියවර 03හි වායුව එක් රැස් කිරීමෙන් පසු ව පිස්ටනය ඉවත් කර සිරින්ජය තුළට පුලිඟු කීරක් ඇතුළු කළ විට එය දීප්තිමත් ව දැල්විණි. මෙම නිරීක්ෂණයට හේතුව වූයේ රැස් වූ වායුව සතු කුමන ගුණය ද?


(v) සිරිංජය තුළ රැස් වූ වායුවේ කාර්මික ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

(vi) පෙළපොතෙහි සඳහන් ආකාරයට වායු පිළියෙල කිරීම වෙනුවට, ඉහත දැක් වූ ක්‍රමය අනුගමනය කිරීමෙන් අත් වන වාසියක් සඳහන් කරන්න.

(*B*) නොගැඹුරු මුහුදු පතුලක සිටුවන ලද ඍජු සිලින්ඩරාකාර යකඩ කණුවක් අවුරුදු කිහිපයකට පසු ව විඛාදනය වී තිබූ ආකාරය (1) රූපයේ දැක්වේ.



(1) රූපය



(2) රූපය

යකඩ කණුව නිරීක්ෂණය කළ ශිෂ්‍යයකු විසින් පහත දැක්වෙන කල්පිතය ගොඩනගන ලදී.

'යකඩ සමග ඔක්සිජන් වායුව අඩුවෙන් ගැටෙන ස්ථාන විඛාදනය වන ශීඝ්‍රතාව වැඩි ය.'

මෙම කල්පිතය පරීක්ෂා කිරීම සඳහා ශිෂ්‍යයා (2) රූපයේ දැක්වෙන ඇටවුම සකස් කර තබා පැය කිහිපයකට පසු ව නිරීක්ෂණය කළේ ය. මෙහි දී ඔහුට එහි *Q* ලෙස නම් කර ඇති ප්‍රදේශය නිල් පැහැ වී ඇති බව දක්නට ලැබිණි.

(i) යකඩවල විඛාදනයට අත්‍යවශ්‍ය සාධක මොනවා ද?

(ii) යකඩ දණ්ඩෙන් මුදාහැරෙන, *Q* ප්‍රදේශයේ නිල් පැහැයට හේතු වන ප්‍රභේදය කුමක් ද?

(iii) (a) පරීක්ෂණයේ දී *P* ප්‍රදේශයේ දක්නට ලැබුණු වර්ණය කුමක් ද?
(b) ඔබ ඉහත සඳහන් කළ වර්ණය ඇති වීමට තුඩු දෙන අයන-ඉලෙක්ට්‍රෝන අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

(iv) ජෙලි මාධ්‍යයට සෝඩියම් ක්ලෝරයිඩ් එක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?


(v) පරීක්ෂණයේ ප්‍රතිඵලවලින් ශිෂ්‍යයාගේ කල්පිතය සනාථ වන්නේ ද?

(vi) (a) නිතර මුහුදු ජලය හා ගැටෙන නැව්වල යකඩ බඳ කොටස විඛාදනයෙන් ආරක්ෂා කිරීමට භාවිත වන ක්‍රමයක් සඳහන් කරන්න.
(b) ඔබ ඉහත සඳහන් කළ ක්‍රමය යකඩ විඛාදනය අඩු කිරීමට දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel

(ලකුණු 20 යි)

**7.** (*A*) (i) ජලය සහිත බඳුනක පතුලේ තිබෙන කාසියක් දෙස ඉහළින් බැලූ විට එය ඉහළට එස වී තිබෙන්නා සේ පෙනේ. (1) රූපය ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන එලෙස කාසිය ඉහළට එසවී පෙනෙන ආකාරය දැක්වෙන කිරණ සටහන අඳින්න.




(1) රූපය



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) ගහනතර මාධ්‍යයක සිට විරලතර මාධ්‍යයක් වෙත ගමන් ගන්නා ආලෝක කිරණයක ගහනතර මාධ්‍යය තුළ දී පතන කෝණයේ අවස්ථා තුනක් පහත (2) රූපයේ දැක්වේ.




($X$) පතන කෝණය අවධි කෝණයට වඩා කුඩා ය. ($Y$) පතන කෝණය අවධි කෝණයට සමාන ය. ($Z$) පතන කෝණය අවධි කෝණයට වඩා විශාල ය.

(2) රූපය

(a) අවධි කෝණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(b) (2) රූපය ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන ($X$), ($Y$) සහ ($Z$) අවස්ථාවල කිරණයේ ඉදිරි ගමන් මග දක්වමින් කිරණ සටහන් සම්පූර්ණ කරන්න.
(c) (2) රූපයේ ($Z$) අවස්ථාවේ සිදු වන සංසිද්ධිය නම් කරන්න.
(d) ඉහත (c) හි නම් කරන ලද සංසිද්ධිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරිපත් කරන්න.

($B$) ක්ෂමතාව 1000 W ලෙස සඳහන් කර ඇති විදුලි කේතලයක් භාවිතයෙන් තේ කෝප්ප හතරක් සෑදීමට අවශ්‍ය ජල ප්‍රමාණයක් නැටවීමට ගත වන කාලය මිනිත්තු තුනකි.
(i) මෙහි දී වැය වූ විද්‍යුත් ශක්ති ප්‍රමාණය ගණනය කරන්න.
(ii) එම විද්‍යුත් ශක්ති ප්‍රමාණය kWh වලින් කොපමණ ද? ($1\ \text{kWh} = 3.6 \times 10^6\ \text{J}$ වේ.)
(iii) තේ කෝප්ප හතරක් සෑදීමට, තේ කෝප්ප අටකට අවශ්‍ය ජල ප්‍රමාණයක් නැටවීම සිදු කළ හොත් අපතේ යන විද්‍යුත් ශක්ති ප්‍රමාණය kWh වලින් කොපමණ ද?


($C$) මෝටර් රථයක් සරල රේඛීය මාර්ගයක $10\ \text{m s}^{-1}$ ($36\ \text{km h}^{-1}$) ඒකාකාර වේගයකින් ධාවනය වන විට රථයේ රියදුරා 4 m දුරින් ඇති බාධකයක් දකියි. එහි දී අනතුරක් සිදුවීම වැළැක්වීම සඳහා ඔහු රෝධක යොදයි. රෝධක යෙදිය යුතු බව තීරණය කළ මොහොතේ සිට රෝධක යෙදීම ක්‍රියාත්මක කිරීම සඳහා ගත වන කාලය, එනම් ඔහුගේ ප්‍රතික්‍රියා කාලය 0.2 s වේ.
(i) රථය 0.2 s කාලය තුළ ගමන් කළ දුර සොයන්න.
(ii) රෝධක මගින් යොදන ලද මන්දනය $40\ \text{m s}^{-2}$ වූ අතර එම මන්දනය යටතේ රථය නතර වන තෙක් ගමන් කළ දුර 1.25 m විය.
(a) රියදුරා හට අනතුර වළක්වා ගත හැකි වූයේ ද?
(b) රථයේ ස්කන්ධය 1000 kg නම් රෝධක මගින් යොදන ලද බලය කොපමණ ද?
(c) නිදිබර ව හෝ මත්පැන් පානය කර හෝ සිටින රියදුරකුගේ ප්‍රතික්‍රියා කාලය 0.3 s වූ අවස්ථාවක දී ඉහත බලය යෙදීමෙන් අනතුර වළක්වා ගැනීමට හැකි වේ ද යන්න ගණනය කිරීමකින් පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

**8.** ($A$) ප්‍රෝටීන්, ලිපිඩ හා නියුක්ලෙයික් අම්ල යනු සජීව පදාර්ථයේ අඩංගු මූලික කාබනික සංයෝග වර්ග තුනකි.
(i) ප්‍රෝටීන්, ලිපිඩ හා නියුක්ලෙයික් අම්ල කාබනික සංයෝග ලෙස හඳුන්වන්නේ ඇයි?
(ii) ප්‍රෝටීනවල අඩංගු විය හැකි එහෙත් ලිපිඩවල අඩංගු **නොවන** මූලද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.
(iii) ප්‍රෝටීනවල තැනුම් ඒකකය නම් කරන්න.
(iv) ප්‍රෝටීන හා ලිපිඩ යන සංයෝගවල පොදු කෘත්‍යයක් සඳහන් කරන්න.
(v) නියුක්ලෙයික් අම්ල ප්‍රධාන ආකාර දෙකකි. ඉන් එකක් DNA ලෙස හැඳින්වේ. අනෙක් වර්ගය කුමක් ද?
(vi) ජීවී සෛලයක DNA අන්තර්ගත ඉන්ද්‍රියිකාව නම් කරන්න.
(vii) ජාන තාක්ෂණයේ දී ජීවියෙකුගේ ප්‍රවේණිදර්ශය වෙනස් කරනු ලබන ආකාරය පැහැදිලි කරන්න.
(viii) ජාන තාක්ෂණය භාවිතයෙන් ඉනිසියුලින් නිපදවීමට භාවිත කරන ක්ෂුද්‍රජීවී විශේෂය නම් කරන්න.
(ix) අපරාධයක් සිදු වූ ස්ථානයකින් ලබාගත් හිසකෙස් සාම්පලයක් යොදා ගෙන එම අපරාධයේ සැකකරු විසින් අපරාධය සිදු කළ බව තහවුරු කළ යුතු ව ඇත. ඒ සඳහා ජාන තාක්ෂණය යොදා ගන්නා ආකාරය සඳහන් කරන්න.

Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel
Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/


(*B*) *A* හා *B* විද්‍යුත් උපකරණ දෙකක් 6 V බැටරියකට සම්බන්ධ කර ඇති ආකාරය පහත රූපයේ දැක්වේ. *A* හි පිරිවිතර 6 V, 12 W ලෙස ද, *B* හි පිරිවිතර 4 V, 0.5 A ලෙස ද සඳහන් කර ඇත. $S_1$ හා $S_2$ ස්විච්ච දෙකකි.




(i) *A* හා *B* පරිපථයට සම්බන්ධ කර ඇති ආකාරය නම් කරන්න.
(ii) $S_1$ ස්විච්චය වසා ඇති විට *A* තුළින් ගලා යන ධාරාව කොපමණ ද?
(iii) *B* හි පිරිවිතර 4 V, 0.5 A ලෙස සඳහන් කිරීමෙන් අදහස් කරන්නේ කුමක් ද?
(iv) $S_2$ ස්විච්චය වසා ඇති විට *B* උපකරණය පිරිවිතරවලට අනුකූල ව ක්‍රියාත්මක විය යුතු ය.
 (a) මේ සඳහා *R* හරහා තිබිය යුතු විභව අන්තරය කොපමණ ද?
 (b) මෙහි දී *R* තුළින් ගලා යන ධාරාව කොපමණ ද?
 (c) *R* සඳහා තිබිය යුතු අගය ගණනය කරන්න.
(v) උපකරණ දෙක ම ක්‍රියාත්මක වන විට බැටරියෙන් ලබා ගන්නා ධාරාව කොපමණ ද?

(ලකුණු 20 යි)


**9.** (*A*) ශිෂ්‍යයෙක් 0.1 mol $dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් 30 °C හි පවතින හයිඩ්‍රොක්ලෝරික් අම්ල (HCl) ද්‍රාවණ 50 $cm^3$ ක් පොලිස්ටයිරීන් කෝප්පයකට එක්කර එයට උෂ්ණත්වමානයක් ඇතුළු කළේ ය. ඉන්පසු ව එම කෝප්පයට ම 0.1 mol $dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් 30 °C හි පවතින සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් (NaOH) ද්‍රාවණ 50 $cm^3$ ක් එකතු කරන ලදී.




Scan By : "Mathematics With Asela Nissanka" Youtube channel

(i) ද්‍රාවණ දෙක මිශ්‍ර කළ පසු මිශ්‍රණය ළඟා වූ උපරිම උෂ්ණත්වය 38 °C කි. මිශ්‍රණයේ උෂ්ණත්වය ඉහළ යාමට හේතුව පැහැදිලි කරන්න.
(ii) මිශ්‍රණය ළඟා වූ උපරිම උෂ්ණත්වය 38 °C ට වඩා ඉහළ අගයක් කරා ගෙන යාමට
 (a) ඉහත ඇටවුමේ
 (b) ප්‍රතික්‍රියක සාන්ද්‍රණයෙහි
 කළ යුතු ව තිබුණු වෙනසක් සඳහන් කරන්න.
(iii) උක්ත පරීක්ෂණයේ දී යොදා ගත් NaOH ද්‍රාවණ පරිමාවෙහි තිබූ NaOH මවුල ප්‍රමාණයම අඩංගු ඝන NaOH ප්‍රමාණයක් භාවිත කර පරීක්ෂණය නැවත සිදු කිරීමට නියමිත ය. මෙහි දී ද මිශ්‍රණය ළඟා වන උපරිම උෂ්ණත්වය 38 °C බව ශිෂ්‍යයෙක් ප්‍රකාශ කරයි.
 (a) ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නෙහි ද?
 (b) ඔබේ පිළිතුරට හේතු පහදන්න.
(iv) (a) මෙම පරීක්ෂණයේ දී සිදු වන ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.
 (b) මෙම ප්‍රතික්‍රියාව උදාසීනීකරණ ප්‍රතික්‍රියාවක් ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කරන්න.
(v) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ප්‍රබල අම්ලයක් ලෙස සලකන්නේ ඇයි?
(vi) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්වල කාර්මික භාවිතයක් සඳහන් කරන්න.

(*B*) (i) විද්‍යුත් ධාරාවක් ගමන් ගන්නා සෘජු සන්නායකයක් වටා චුම්බක ක්ෂේත්‍රයක් ඇති වේ.
 (a) රූපසටහනක් භාවිත කරමින්, එබඳු සන්නායකයක් තුළින් ගමන් ගන්නා ධාරාවේ දිශාව ද එහි දී හට ගන්නා චුම්බක බල රේඛාවල හැඩය හා දිශාව ද පෙන්නුම් කරන්න.
 (b) සන්නායකය දඟරයක් ආකාරයට සකස් කර ගෙන ධාරාවක් යැවීමෙන් තනා ගන්නා විද්‍යුත්-චුම්බක ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරිපත් කරන්න.
(ii) රූපයේ දැක්වෙන පරිදි චුම්බක ක්ෂේත්‍රයකට ලම්බක ව ධාරාවක් රැගෙන යන සන්නායකයක් තැබූ විට එය මත බලයක් ක්‍රියාකරයි.




 (a) ඉහත සන්නායකය මත ක්‍රියා කරන බලයේ විශාලත්වය කෙරෙහි බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.
 (b) සන්නායකය මත ක්‍රියා කරන බලයේ දිශාව සොයා ගැනීමට භාවිත වන නීතිය නම් කරන්න.
 (c) ඉහත ආකාරයට ඇති කර ගන්නා බලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරිපත් කරන්න.

(*C*) ජල විදුලි බලාගාරයක විදුලිය නිපදවීම විද්‍යුත්-චුම්බක ප්‍රේරණ මූලධර්මය මත පදනම් වේ.
(i) විද්‍යුත්-චුම්බක ප්‍රේරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ජල විදුලි බලාගාරයකින් නිපදවෙන විදුලි ධාරාවත්, සූර්ය පැනලයකින් නිපදවෙන විදුලි ධාරාවත් කාලයට එරෙහි ව විචලනය වන අන්දම වෙන වෙන ම ප්‍රස්තාරික ව නිරූපණය කරන්න.

(ලකුණු 20 යි)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4

42139

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 34 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

විද්‍යාව II
விஞ்ஞானம் II
Science II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes


අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ....................

**උපදෙස් :**
* පැහැදිලි අත් අකුරෙන් පිළිතුරු ලියන්න.
* **A** කොටසේ ප්‍රශ්න හතරට ම දී ඇති ඉඩ ප්‍රමාණය තුළ පිළිතුරු සපයන්න.
* **B** කොටසේ ප්‍රශ්න පහෙන් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු සපයා අවසානයේ **A** කොටස හා **B** කොටසේ පිළිතුරු පත්‍රය එකට අමුණා භාරදෙන්න.

## A කොටස

**1. (A)** ගෘහස්ථ වායු දූෂණය ඇති වන්නේ නිවාස ඇතුළත මුදා හැරෙන හානිකර දූෂක මගිනි. ගෘහස්ථ වායු දූෂණය එළිමහන් වායු දූෂණයට වඩා කිහිප ගුණයකින් හානිකර ය. පහත රූපයෙන් දැක්වෙන්නේ ගෘහස්ථ වායු දූෂණයට ලක් වන නිවසක විවිධ ස්ථාන සහ ඉන් එක් ස්ථානයක පැවතිය හැකි දූෂක පිළිබඳවයි.




පහත වගුවේ දැක්වෙන එක් එක් ප්‍රකාශය සඳහා නිදසුන් වන ස්ථානයක් ඉහත රූපයෙන් හඳුනාගෙන ඉදිරියෙ[න්] ඇති කොටුවෙහි ලියන්න.

| | ප්‍රකාශය | ස්ථානය |
|---|---|---|
| (i) | අම්ල වැසි ඇති කිරීමට සහ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට දායක වන විෂ වායු සහ වාෂ්පශීලී හයිඩ්‍රොකාබන ඒ ස් විය හැකි ය. | |
| (ii) | සුවඳ විලවුන්, හිය ආලේපන ආදිය භාවිතයේ දී නිකුත් වන වාෂ්පශීලී කාබනික දූෂක මගින් වැඩි වශයෙන් දූෂණයට ලක් වේ. | |
| (iii) | රෝගකාරක ක්ෂුද්‍රජීවීන්, පුස්, දිලීර සහ දුර්ගන්ධය නිකුත් කරමින් නිරතුරු ව ගෘහස්ථ වායු දූෂණයට දායක වේ. | |
| (iv) | ලී බඩු සහ බිත්ති මත ආලේපිත තීන්තවලින් නිකුත් වන වාෂ්පශීලී කාබනික දූෂක සහ බුමුතුරුණුවලින් නිකුත් වන ඝන අංශුමය දූෂක සුලබ ව පැවතිය හැකි ය. | |

**(v)** ගෘහස්ථ වායු දූෂණය සිදු කර නිවැසියන් පෙණහලු පිළිකා, හෘදයාබාධ, ආඝාතය ආදී රෝගවලට ගො[...] කරවන පුද්ගල ඇබ්බැහි වීමක් සඳහන් කරන්න.

..........................................................................................

**(vi)** ගෘහස්ථ වායු දූෂණය ස්වාභාවික ව පාලනය කිරීමට මෙම නිවසෙහි යොදා ගෙන ඇති පරිසර හිත[...] ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. ..........................................................................................


**(vii)** ගෘහ නිර්මාණයේ දී ගෘහස්ථ වායු දූෂණය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් යෝජනා කරන්[...]

..........................................................................................

[දෙවැනි පිටුව

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) ඝනතර මාධ්‍යයක සිට විරලතර මාධ්‍යයක් වෙත ගමන් ගන්නා ආලෝක කිරණයක ගමන් මාර්ගය
තුළ දී පතන කෝණයේ අවස්ථා තුනක් පහත (2) රූපයේ දැක්වේ.




(X) පතන කෝණය අවධි කෝණයට වඩා කුඩා ය.
(Y) පතන කෝණය අවධි කෝණයට සමාන ය.
(Z) පතන කෝණය අවධි කෝණයට වඩා විශාල ය.

(2) රූපය

(a) අවධි කෝණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(b) (2) රූපය ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන (X), (Y) සහ (Z) අවස්ථාවල කිරණයේ ඉදිරි ගම
මග දක්වමින් කිරණ සටහන් සම්පූර්ණ කරන්න.
(c) (2) රූපයේ (Z) අවස්ථාවේ සිදු වන සංසිද්ධිය නම් කරන්න.
(d) ඉහත (c) හි නම් කරන ලද සංසිද්ධිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරි
කරන්න.

(B) ක්ෂමතාව 1000 W ලෙස සඳහන් කර ඇති විදුලි කේතලයක් භාවිතයෙන් තේ කෝප්ප හතරක් සෑදීමට අව
ජල ප්‍රමාණයක් නැටවීමට ගත වන කාලය මිනිත්තු තුනකි.
(i) මෙහි දී වැය වූ විද්‍යුත් ශක්ති ප්‍රමාණය ගණනය කරන්න.
(ii) එම විද්‍යුත් ශක්ති ප්‍රමාණය kWh වලින් කොපමණ ද? (1 kWh = $3.6 \times 10^6$ J වේ.)
(iii) තේ කෝප්ප හතරක් සෑදීමට, තේ කෝප්ප අටකට අවශ්‍ය ජල ප්‍රමාණයක් නැටවීම සිදු කළ හොත් අප
යන විද්‍යුත් ශක්ති ප්‍රමාණය kWh වලින් කොපමණ ද?

(C) මෝටර් රථයක් සරල රේඛීය මාර්ගයක $10\ m\ s^{-1}$ ($36\ km\ h^{-1}$) ඒකාකාර වේගයකින් ධාවනය වන විට ර
රියදුරා 4 m දුරින් ඇති බාධකයක් දකියි. එහි දී අනතුරක් සිදුවීම වැළැක්වීම සඳහා ඔහු රෝධක යොදයි. රෝ
යෙදිය යුතු බව තීරණය කළ මොහොතේ සිට රෝධක යෙදීම ක්‍රියාත්මක කිරීම සඳහා ගත වන කාලය,
ඔහුගේ ප්‍රතික්‍රියා කාලය 0.2 s වේ.
(i) රථය 0.2 s කාලය තුළ ගමන් කළ දුර සොයන්න.
(ii) රෝධක මගින් යොදන ලද මන්දනය $40\ m\ s^{-2}$ වූ අතර එම මන්දනය යටතේ රථය නතර වන තෙක්
කළ දුර 1.25 m විය.
(a) රියදුරා හට අනතුර වළක්වා ගත හැකි වූයේ ද?
(b) රථයේ ස්කන්ධය 1000 kg නම් රෝධක මගින් යොදන ලද බලය කොපමණ ද?
(c) නිදිබර ව හෝ මත්පැන් පානය කර හෝ සිටින රියදුරකුගේ ප්‍රතික්‍රියා කාලය 0.3 s වූ අවස්ථාවක
බලය යෙදීමෙන් අනතුර වළක්වා ගැනීමට හැකි වේ ද යන්න ගණනය කිරීමකින් පැහැදිලි කර
(ලකුණු


(A) ප්‍රෝටීන්, ලිපිඩ හා නියුක්ලෙයික් අම්ල යනු සජීව පදාර්ථයේ අඩංගු මූලික කාබනික සංයෝග වර්ග තු
(i) ප්‍රෝටීන්, ලිපිඩ හා නියුක්ලෙයික් අම්ල කාබනික සංයෝග ලෙස හඳුන්වන්නේ ඇයි?
(ii) ප්‍රෝටීනවල අඩංගු විය හැකි එහෙත් ලිපිඩවල අඩංගු **නොවන** මූලද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.
(iii) ප්‍රෝටීනවල තැනුම් ඒකකය නම් කරන්න.
(iv) ප්‍රෝටීන හා ලිපිඩ යන සංයෝගවල පොදු කෘත්‍යයක් සඳහන් කරන්න.
(v) නියුක්ලෙයික් අම්ල ප්‍රධාන ආකාර දෙකකි. ඉන් එකක් DNA ලෙස හැඳින්වේ. අනෙක් වර්ගය ක
(vi) ජීවී සෛලයක DNA අන්තර්ගත ඉන්ද්‍රියිකාව නම් කරන්න.
(vii) ජාන තාක්ෂණයේ දී ජීවියෙකුගේ ප්‍රවේණිදර්ශය වෙනස් කරනු ලබන ආකාරය පැහැදිලි කරන්න
(viii) ජාන තාක්ෂණය භාවිතයෙන් ඉනිසියුලින් නිපදවීමට භාවිත කරන ක්ෂුද්‍රජීවී විශේෂය නම් කරන්
(ix) අපරාධයක් සිදු වූ ස්ථානයකින් ලබාගත් හිසකෙස් සාම්පලයක් යොදා ගෙන එම අපරාධයේ
විසින් අපරාධය සිදු කළ බව තහවුරු කළ යුතු ව ඇත. ඒ සඳහා ජාන තාක්ෂණය යොදා ගන්නා
සඳහන් කරන්න.




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(B) ක්ෂුද්‍ර ප්ලාස්ටික් යනු 5 mmට වඩා අඩු දිගින් යුතු ඕනෑ ම ප්ලාස්ටික් වර්ගයක විවිධ හැඩයෙන් යුතු කැබැලි වේ. පොලිඑතිලීන් (PE), පොලිප්‍රොපිලීන් (PP), පොලිඑතිලීන් ටෙරිප්තැලේට් (PET), පොලිඑස්ටර් සහ රේයොන් යන බහුඅවයවික වර්ගවලින් සැදුම් ලත් ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු වගා බිමකින් හමු වී ඇත.
බහුඅවයවික වර්ගය අනුව වගා බිමෙන් හමු වූ ක්ෂුද්‍ර ප්ලාස්ටික්වල ප්‍රතිශත සංයුතිය A රූපයෙන් දැක්වෙන අතර විවිධ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ආකාර සැදුම්ලත් බහුඅවයවික වර්ගවල ප්‍රතිශත සංයුතිය B රූපයෙන් දැක්වේ.

A රූපය




B රූපය




රූපවල දැක්වෙන තොරතුරු ඇසුරින් පහත ප්‍රකාශවල හිස්තැන් පුරවන්න.

(i) A රූපයට අනුව වගා බිමෙහි සුලබ ව ම පවතින බහුඅවයවික වර්ගය .............................. වේ.

(ii) A රූපයට අනුව .............................. බහුඅවයවිකයෙහි සහ .............................. බහුඅවයවිකයෙහි ප්‍රතිශත සංයුතිවල එකතුව PP හි ප්‍රතිශත සංයුතියට දළ වශයෙන් සමාන වේ.

(iii) B රූපයට අනුව වගා බිමෙහි පටල ආකාරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ලෙස පවතින බහුඅවයවික වනුයේ .............................. සහ .............................. වේ.

(iv) විවිධ බහුඅවයවික වැඩි ම සංඛ්‍යාවකින් යුක්ත වන්නේ .............................. ආකාරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ය.

(v) වගා බිමට ක්ෂුද්‍ර ප්ලාස්ටික් එකතු විය හැකි ආකාරයක් සඳහන් කරන්න.

..............................................................................................................................

(vi) යූරියා පොහොර නියැදියක අන්තර්ගත වන ක්ෂුද්‍ර ප්ලාස්ටික් වෙන්කර ගැනීමට ක්‍රමයක් යෝජනා කරන්න.

..............................................................................................................................

2. (A) ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා සූදානම් වන ශිෂ්‍ය කණ්ඩායමක් විසින් හොඳින් හිරු එළියට නිරාවරණය වන තැනක වැවෙන වද ශාකයක සුදු පැහැති හා කොළ පැහැති ප්‍රදේශ සහිත පත්‍රයක රූපසටහනක් කඩදාසියක සටහන් කර ගන්නා ලදී. එම රූපසටහන දකුණු පසින් දැක්වේ. පසු ව අදාළ පියවර අනුගමනය කරමින් එම පත්‍රය පිෂ්ට පරීක්ෂාවට ලක් කරන ලදී.




(i) පිෂ්ටය හඳුනා ගැනීම සඳහා භාවිත කරන රසායන ද්‍රව්‍යය නම් කරන්න. ..............................

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ රසායන ද්‍රව්‍යය යෙදූ පසු ලැබුණු නිරීක්ෂණ පහත වගුවේ දක්වන්න.

| පත්‍රයේ පරීක්ෂාවට ලක් කළ ප්‍රදේශය | නිරීක්ෂණය |
|---|---|
| (a) කොළ පැහැති ප්‍රදේශ | |
| (b) සුදු පැහැති ප්‍රදේශ | |

(iii) ඉහත පරීක්ෂාවේ දී පත්‍රයේ කොළ සහ සුදු පැහැති ප්‍රදේශ ආශ්‍රිත ව ලද නිරීක්ෂණ අනුව එළඹිය හැකි නිගමනය කුමක් ද? ..............................

(B) නිවෙසේ හෝ ගෙවත්තේ දී දැකිය හැකි සත්ත්ව විශේෂ කිහිපයක් පහත දැක්වේ.

කැරපොත්තා, හූනා, මකුළුවා, ගොළුබෙල්ලා, කුඩැල්ලා, පත්තෑයා

පහත එක් එක් ලක්ෂණය සහිත සත්ත්ව විශේෂය ඉහත ලැයිස්තුවෙන් තෝරා ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

(i) කශේරුවක් දරයි. ..............................


(ii) සන්ධිත පාදයක් ඇත. ..............................

[තුන්වැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) [illegible]
(a) කැල්සියම් හා ක්ලෝරීන් ..............................
(b) ක්ලෝරීන් හා ඔක්සිජන් : ..............................


(iii) බෙරිලියම් හා ක්ලෝරීන් සංයෝජනයෙන් සෑදෙන බෙරිලියම් ක්ලෝරයිඩ් සහසංයුජ සංයෝගයකි. දී ඇති කොටුව තුළ බෙරිලියම් ක්ලෝරයිඩ් අණුවෙහි තිත්-කතිර ව්‍යුහය අඳින්න.




(iv) කැල්සියම් හා ඔක්සිජන් සංයෝජනයෙන් සෑදෙන කැල්සියම් ඔක්සයිඩ් අයනික සංයෝගයකි. කැල්සියම් ඔක්සයිඩ්වල
(a) කැල්සියම් අයනයේ ආරෝපණය
(b) ඔක්සයිඩ් අයනයේ අවසන් කවචයේ සියලු ම ඉලෙක්ට්‍රෝන රූපයේ දක්වන්න.




) 1 රූපයේ දැක්වෙන පුනීලයේ කට තදින් ඇදී තිබෙන රබර් පටලයකින් සම්පූර්ණයෙන් ම වසා ඇත. පුනීලයේ අනෙක් කෙළවර, වර්ණවත් ජලයෙන් අඩක් පුරවා ඇති U නලයක එක් බාහුවකට රබර් බටයකින් සම්බන්ධ කර ඇත.



1 රූපය

(i) 1 රූපයෙන් දැක්වෙන පිහිටුමේ දී රබර් පටලය මත ඉහළින් ඇඟිල්ලක් තබා මදක් තෙරපන විට U නලයේ බාහුවල ජල මට්ටම් කෙසේ වෙනස් වේ ද?
(a) X බාහුව .................. (b) Y බාහුව ..........................


(ii) ඉහත (i) හි නිරීක්ෂණයට හේතුව පැහැදිලි කරන්න.

..................................................................................................

(iii) ඉහත ඇටවුමේ පුනීලයේ කට වාතය තුළ විවිධ දිශාවලට හැරවූව ද U නලයේ ජල මට්ටම් වෙනස් නොවී පවතී. මෙයට හේතුව කුමක් ද?

..................................................................................................

..................................................................................................



2 රූපය

(iv) රබර් පටලය සහිත පුනීලය 2 රූපයේ දැක්වෙන පරිදි ජල බඳුනක සිල්වා ක්‍රමයෙන් බඳුනේ පතුලට ගෙන යාමේ දී U නලයේ බාහුවල ජල මට්ටම් කෙසේ වෙනස් වේ ද?
(a) X බාහුව .................................. (b) Y බාහුව ..................................

(v) ඉහත (iv) හි නිරීක්ෂණ අනුව එළඹිය හැකි නිගමනය සඳහන් කරන්න.

..................................................................................................

(vi) 2 රූපයේ පුනීලය සහිත බඳුනට ජලය වෙනුවට පොල්තෙල් සම පරිමාවක් යොදනු ලැබේ. පුනීලය බඳුනේ පතුලට ආසන්න ව තිබෙන විට U නලයේ ද්‍රව මට්ටම් අතර වැඩි වෙනසක් දැක්වෙන්නේ කුමන ද්‍රව යොදා ඇති විට ද?


..................................................................................................

ජල පෘෂ්ඨයක් ඔස්සේ ගමන් ගන්නා ජල තරංගයක ප්‍රස්තාරික නිරූපණය රූපයේ දැක්වේ.

(i) ජල අංශු කම්පනය වන දිශාව අනුව මෙම තරංගය අයත් වන තරංග වර්ගය නම් කරන්න.

..................................................

..................................................




(ii) ප්‍රස්තාරයෙන් නිරූපිත තරංගයෙහි තරංග ආයාමය සහ විස්තාරය ඉහත රූපයේ ලකුණු කර නම් කර

iii) තරංග ගමන් කරන ජල පෘෂ්ඨය මත සැහැල්ලු ස්ටයිරොෆෝම් (රිජිෆෝම්) කැබැල්ලක් තැබූ විට එය
පහළ චලනය වන බව නිරීක්ෂණය විය. මෙම නිරීක්ෂණයට හේතුව කුමක් ද?

..................................................................................................

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(i) ඉහත ප්‍රතික්‍රියාව ඔබ උගත් ප්‍රතික්‍රියා වර්ගීකරණයට අනුව කුමන වර්ගයේ ප්‍රතික්‍රියාවක් ද?

(ii) ඉහත ප්‍රතික්‍රියාවේ දී මැංගනීස් ඩයොක්සයිඩ්වල ($MnO_2$) කාර්යය කුමක් ද?

(iii) සිරින්ජය තුළ වායුව එක්රැස්වීම ඇරඹී මොහොතේ සිට තත්පර 10 බැගින් වූ අනුයාත කාල ප්‍රාන්තර තුළ දී නිපදවුණු වායු පරිමා මිනුම් කරන ලදී. එම තොරතුරු පහත වගුවේ දැක්වේ.

| කාල ප්‍රාන්තරය | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| එක් වූ වායු පරිමාව/ml | 14 | 9 | 5 | 3 | 1 | 0 |

(a) පළමු කාල ප්‍රාන්තරයේ දී වායුව නිපදවුණු ශීඝ්‍රතාව ගණනය කරන්න.
(b) කාලය ගත වීමේ දී වායුව නිපදවුණු ශීඝ්‍රතාව කෙසේ වෙනස් වී තිබේ ද?
(c) ඉහත (b) හි ඔබ සඳහන් කළ විචලනය සඳහා හේතුව පැහැදිලි කරන්න.

(iv) ඉහත පියවර 03හි වායුව එක් රැස් කිරීමෙන් පසු ව පිස්ටනය ඉවත් කර සිරින්ජය තුළට පුලිඟු සහිත හීරක් ඇතුළු කළ විට එය දීප්තිමත් ව ඇවිළිණි. මෙම නිරීක්ෂණයට හේතුව වූයේ රැස් වූ වායුව සතු කුමන ගුණය ද?


(v) සිරින්ජය තුළ රැස් වූ වායුවේ කාර්මික ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

(vi) පෙළපොතෙහි සඳහන් ආකාරයට වායු පිළියෙල කිරීම වෙනුවට, ඉහත දැක් වූ ක්‍රමය අනුගමනය කිරීමෙන් අත් වන වාසියක් සඳහන් කරන්න.

(B) නොගැඹුරු මුහුදු පතුලක සිටුවන ලද ඝන සිලින්ඩරාකාර යකඩ කණුවක් අවුරුදු කිහිපයකට පසු ව විඛාදනය වී තිබූ ආකාරය (1) රූපයේ දැක්වේ.




(1) රූපය




(2) රූපය

යකඩ කණුව නිරීක්ෂණය කළ ශිෂ්‍යයකු විසින් පහත දැක්වෙන කල්පිතය ගොඩනගන ලදී.

'යකඩ සමග ඔක්සිජන් වායුව අඩුවෙන් ගැටෙන ස්ථාන විඛාදනය වන ශීඝ්‍රතාව වැඩි ය.'

මෙම කල්පිතය පරීක්ෂා කිරීම සඳහා ශිෂ්‍යයා (2) රූපයේ දැක්වෙන ඇටවුම සකස් කර තබා පැය කිහිපයකට පසු ව නිරීක්ෂණය කළේ ය. මෙහි දී ඔහුට එහි $Q$ ලෙස නම් කර ඇති ප්‍රදේශය නිල් පැහැ වී ඇති බව දක්නට ලැබිණි.

(i) යකඩවල විඛාදනයට අත්‍යවශ්‍ය සාධක මොනවා ද?

(ii) යකඩ දණ්ඩෙන් මුදාහැරෙන, $Q$ ප්‍රදේශයේ නිල් පැහැයට හේතු වන ප්‍රභේදය කුමක් ද?

(iii) (a) පරීක්ෂණයේ දී $P$ ප්‍රදේශයේ දක්නට ලැබුණු වර්ණය කුමක් ද?
(b) ඔබ ඉහත සඳහන් කළ වර්ණය ඇති වීමට තුඩු දෙන අයන-ඉලෙක්ට්‍රෝන අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.


(iv) ජෙලි මාධ්‍යයට සෝඩියම් ක්ලෝරයිඩ් එක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?

(v) පරීක්ෂණයේ ප්‍රතිඵලවලින් ශිෂ්‍යයාගේ කල්පිතය සනාථ වන්නේ ද?

(vi) (a) නිතර මුහුදු ජලය හා ගැටෙන නැව්වල යකඩ බඳ කොටස විඛාදනයෙන් ආරක්ෂා කිරීමට භාවිත වන ක්‍රමයක් සඳහන් කරන්න.
(b) ඔබ ඉහත සඳහන් කළ ක්‍රමය යකඩ විඛාදනය අඩු කිරීමට දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

(i) ජලය සහිත බඳුනක පතුලේ තිබෙන කාසියක් දෙස ඉහළින් බැලූ විට එය ඉහළට එසවී තිබෙන්නා සේ පෙනේ. (1) රූපය ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන එලෙස කාසිය ඉහළට එසවී පෙනෙන ආකාරය දැක්වෙන කිරණ සටහන අඳින්න.




(1) රූපය



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

$A$ හා $B$ විද්‍යුත් උපකරණ දෙකක් 6 V බැටරියකට සම්බන්ධ කර ඇති ආකාරය පහත රූපයේ දැක්වේ. $A$ හි පිරිවිතර 6 V, 12 W ලෙස ද, $B$ හි පිරිවිතර 4 V, 0.5 A ලෙස ද සඳහන් කර ඇත. $S_1$ හා $S_2$ ස්විච්ච වේ.

(i) $A$ හා $B$ පරිපථයට සම්බන්ධ කර ඇති ආකාරය නම් කරන්න.

(ii) $S_1$ ස්විච්චය වසා ඇති විට $A$ තුළින් ගලා යන ධාරාව කොපමණ ද?


(iii) $B$ හි පිරිවිතර 4 V, 0.5 A ලෙස සඳහන් කිරීමෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) $S_2$ ස්විච්චය වසා ඇති විට $B$ උපකරණය පිරිවිතරවලට අනුකූල ව ක්‍රියාත්මක විය යුතු ය.

(a) මේ සඳහා $R$ හරහා තිබිය යුතු විභව අන්තරය කොපමණ ද?


(b) මෙහි දී $R$ තුළින් ගලා යන ධාරාව කොපමණ ද?

(c) $R$ සඳහා තිබිය යුතු අගය ගණනය කරන්න.




(v) උපකරණ දෙක ම ක්‍රියාත්මක වන විට බැටරියෙන් ලබා ගන්නා ධාරාව කොපමණ ද? (ලකුණු 20 යි)

ශිෂ්‍යයෙක් 0.1 $mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් 30 °C හි පවතින හයිඩ්‍රොක්ලෝරික් අම්ල (HCl) ද්‍රාවණ 50 $cm^3$ ක් පොලිස්ටයිරීන් කෝප්පයකට එක්කර එයට උෂ්ණත්වමානයක් ඇතුළු කළේ ය. ඉන්පසු ව එම කෝප්පයට ම 0.1 $mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් 30 °C හි පවතින සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් (NaOH) ද්‍රාවණ 50 $cm^3$ ක් එකතු කරන ලදී.




(i) ද්‍රාවණ දෙක මිශ්‍ර කළ පසු මිශ්‍රණය ලබා වූ උපරිම උෂ්ණත්වය 38 °C කි. මිශ්‍රණයේ උෂ්ණත්වය ඉහළ යාමට හේතුව පැහැදිලි කරන්න.

(ii) මිශ්‍රණය ලබා වූ උපරිම උෂ්ණත්වය 38 °C ට වඩා ඉහළ අගයක් කරා ගෙන යාමට

(a) ඉහත ඇටවුමෙහි

(b) ප්‍රතික්‍රියක සාන්ද්‍රණයෙහි

කළ යුතු ව තිබුණු වෙනසක් සඳහන් කරන්න.

(iii) උක්ත පරීක්ෂණයේ දී යොදා ගත් NaOH ද්‍රාවණ පරිමාවෙහි තිබූ NaOH මවුල ප්‍රමාණයම අඩංගු ඝන NaOH ප්‍රමාණයක් භාවිත කර පරීක්ෂණය නැවත සිදු කිරීමට නියමිත ය. මෙහි දී ද මිශ්‍රණය ලබා වන උපරිම උෂ්ණත්වය 38 °C බව ශිෂ්‍යයෙක් ප්‍රකාශ කරයි.

(a) ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නෙහි ද?

(b) ඔබේ පිළිතුරට හේතු පහදන්න.

(iv) (a) මෙම පරීක්ෂණයේ දී සිදු වන ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(b) මෙම ප්‍රතික්‍රියාව උදාසීනීකරණ ප්‍රතික්‍රියාවක් ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කරන්න.

(v) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ප්‍රබල අම්ලයක් ලෙස සලකන්නේ ඇයි?


(vi) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්වල කාර්මික භාවිතයක් සඳහන් කරන්න.

(i) විද්‍යුත් ධාරාවක් ගමන් ගන්නා කෙළින් සන්නායකයක් වටා චුම්බක ක්ෂේත්‍රයක් ඇති වේ.

(a) රූපසටහනක් භාවිත කරමින්, එබඳු සන්නායකයක් තුළින් ගමන් ගන්නා ධාරාවේ දිශාව ද එහි ඇති වන චුම්බක බල රේඛාවල හැඩය හා දිශාව ද පෙන්නුම් කරන්න.

(b) සන්නායකය දඟරයක් ආකාරයට සකස් කර ගෙන ධාරාවක් යැවීමෙන් තනා ගන්නා විද්‍යුත්-චුම්බක ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරිපත් කරන්න.

(ii) රූපයේ දැක්වෙන පරිදි චුම්බක ක්ෂේත්‍රයකට ලම්බක ව ධාරාවක් රැගෙන යන සන්නායකයක් තැබූ විට එය මත බලයක් ක්‍රියාකරයි.




(a) ඉහත සන්නායකය මත ක්‍රියා කරන බලයේ විශාලත්වය කෙරෙහි බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(b) සන්නායකය මත ක්‍රියා කරන බලයේ දිශාව සොයා ගැනීමට භාවිත වන නීතිය නම් කරන්න.

(c) ඉහත ආකාරයට ඇති කර ගන්නා බලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා **දෙකක්** සඳහා උදාහරණ ඉදිරිපත් කරන්න.

විදුලි බලාගාරයක විදුලිය නිපදවීම විද්‍යුත්-චුම්බක ප්‍රේරණ මූලධර්මය මත පදනම් වේ.

විද්‍යුත්-චුම්බක ප්‍රේරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ජල විදුලි බලාගාරයකින් නිපදවෙන විදුලි ධාරාවත්, සූර්ය පැනලයකින් නිපදවෙන විදුලි ධාරාවත් කාලය එරෙහි ව විචලනය වන අන්දම වෙන වෙන ම ප්‍රස්තාරික ව නිරූපණය කරන්න. (ලකුණු

***


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) දේහය සමාන ඛණ්ඩවලට බෙදී ඇත. ..........................................

(iv) පාද යුගල් හතරක් දරයි. ..........................................

(v) හිස, උරස හා උදරය ලෙස වැශ්මා තුනකින් සමන්විත දේහයක් ඇත. ..........................................

(C) මානව ප්‍රජනනයේ දී කලලය සෑදීම දක්වා වූ පියවර පහත ගැලීම් සටහනේ දක්වා ඇත. මෙහි සෘජුකෝණාස්‍ර තුළ ව්‍යුහ/සෛල ද ඉලිප්ස තුළ ක්‍රියාවලි ද දක්වා ඇත.





(i) X, Y හා Z ලෙස දක්වා ඇති ව්‍යුහ/සෛල එම සෘජුකෝණාස්‍ර තුළ ලියා දක්වන්න.

(ii) B ලෙස දැක්වෙන ක්‍රියාවලිය එම ඉලිප්සය තුළ ලියා දක්වන්න.

(iii) B ක්‍රියාවලිය සිදු වන්නේ කුමන ස්ථානයේ දී ද? ..........................................

3. (A) හුමාල ආසවනය, සරල ආසවනය හා භාගික ආසවනය යනු මිශ්‍රණවල සංඝටක වෙන් කර ගැනීම සඳහා භාවිත කළ හැකි ආසවන ක්‍රම තුනකි. එම එක් එක් ක්‍රමයෙන් ආසවනය සිදු කිරීමට සකස් කළ P, Q හා R ඇටවුම් තුනක් පහත දැක්වේ (අනුපිළිවෙළින් නො වේ).

(i) P, Q හා R ඇටවුම් යොදා ගැනෙන ආසවන ක්‍රමය අදාළ රූපය යටින් ලියන්න.




P : .............................. Q : .............................. R : ..............................

(ii) X අකුරින් හඳුන්වා ඇති උපකරණය නම් කරන්න. ..........................................


(iii) පහත දැක්වෙන වෙන් කිරීම් සඳහා ඉහත දැක්වෙන ක්‍රම අතරින් වඩාත් ම යෝග්‍ය ආසවන ක්‍රමය කුමක් දැයි ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

(a) ද්‍රව හයිඩ්‍රොකාබන මිශ්‍රණයක සංඝටක වෙන් කර ගැනීම : ..........................................

(b) කුරුඳු කොළවලින් කුරුඳු තෙල් නිස්සාරණය කර ගැනීම : ..........................................

(c) මුහුදු ජලයෙන් ලවණ රහිත පිරිසිදු ජලය ලබා ගැනීම : ..........................................

(B) බෙරිලියම්, ඔක්සිජන්, ක්ලෝරීන්, පොටෑසියම් හා කැල්සියම් යන මූලද්‍රව්‍ය ආවර්තිතා වගුවේ පිහිටන ස්ථාන රූපයේ දැක්වේ.




(i) දී ඇති මූලද්‍රව්‍ය අතරින් පහත වගුවේ සඳහන් එක් එක් ලක්ෂණය පෙන්වන මූලද්‍රව්‍යයේ සංකේතය ඉදිරියෙන් ඇති හිස් කොටුවේ ලියන්න.

| මූලද්‍රව්‍යයේ ලක්ෂණය | සංකේතය |
|---|---|
| (a) ද්විපරමාණුක අණු ලෙස පවතින වර්ණවත් වායුවකි. | |
| (b) වැඩි ම විද්‍යුත්-සෘණතාවෙන් යුතු වේ. | |
| (c) අවම ප්‍රථම අයනීකරණ ශක්තිය සහිත වේ. | |

[හතරවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/